# සොඳුරු යාත්‍රිකයෙකුගේ දේශාටන සටහන්

ඩබ්.පී.එම්.එච්.ආර්.ගුණතිලක

මෙම කෘතියට පාදක වූයේ Gulliver's Travels නම් උපහාස කතාවයි. එය මුලින්ම පළ වූයේ එංගලන්තයේදීය.පල වූ වසර 1726 වේ.ලොව විවිධ රටවල පැතිරි මෙම කතාව ශ්‍රී ලංකීය දරුවන්ගේ මනසට ගෝචර වන අයුරින් අනුවර්තනය කිරීමට වික්‍රමසිංහයන් සමත්වී තිබීම විශේෂයෙන් සඳහන් කළ යුත්තකි.
මෙම කතාවේ එන කථානායකයා ඉතා මහන්සියෙන් අධ්‍යාපනය හදාරා වෛද්‍යවරයෙකු බවට පත්වී නාවික සේවයේ නියුතුව සිටියේය. නොයෙක් අවස්ථාවල දි විවිධ නාවිකයන් සමඟ නොයෙක් රටවල දේශාටනයේ යෙදීමට මොහුට හැකි විය.එසේ යාත්‍රා කරන විට දිනක් දක්ෂිණ සාගරයේ පෙරදිග කොදෙව්ව බලා යාත්‍රා කරද්දී මොවුන්ගේ නැව චන්ඩ මාරුතයකට අසු වී වැන්ඩයිමන් ලන්තයේ වයඹ දෙසට පාවිය. කෙසේ හෝ අමාරුවෙන් දිවි බේරාගත් මොහු ඉන් අනතුරුව මුහුණ දුන් සිදුවීම් මෙම ග්‍රන්ථය තුළ ඉතා රසවත් ලෙස අන්තර්ගත කර ඇත .
මොහු පාවි ගසාගෙන යන්නේ ඉතා පුංචි මිනිසුන් හෙවත් කුරුමිට්ටන් සිටින දූපතකටය. එහිදී කුරුමිට්ටන් විසින් මොහු ඇණවලින් හා ලණුවලින් ගැට ගසා සිර කර තබයි.ඔවුන් මොහුව ගලිවරයා ලෙස හඳුන්වනු ලැබීය.
කුරුමිට්ටන් මෙම ගලිවරයා දැක ප්‍රීති විය.එසේම ගලිවරයා ද කුරුමිට්ටන්ගේ හැසිරීමෙන් මහත්සේ විනෝදයට පත් වූ බව කතුවරයා ප්‍රකාශ කරයි.විස්මයට පැමිණි මා මහා හඬින් සිනාසෙන්නට පටන් ගතිමි... මගේ කටේ පුරවන ආහාර ක්ෂණයකින් අන්තර්ධාන වන දුටු කුරුමිට්ටන් විස්මයට පැමිණියෝය... පුලුවන් ඉක්මනින් නැවත නැවතත් ආහාර ගෙනවිත් මට සාත්තු කළහ.මගේ කෑමත් බීමත් බලා සිට විස්මයට පැමිණි ඔවුන් ප්‍රීතියේන් පිනා ගියෝ ... මගේ පපුව උඩදීම සින්දු කියමින් නටන්නට වන්හ. රජතුමා ඇතුලු පරිවාර සේනාව මේ කූටාගාරයට නැග සිත් සේ මා බලා ගත්හ... නැගී සිටි විගස එකම උයනක් මෙන් බබළන අවට ප්‍රදේශය නැරඹූ මා සිත් පිනා ගියේය.දිගින් අඩි හතලිහක් හා පලලින් අඩි හතලිහක් වන සම හතරැස් උයන් වැටකටු බැඳීමෙන් ආවරණය කරන ලදුව මල් අතුල බිම් කැබලි මෙන් මන නුවන් පිනවයි... වම් පැත්තෙහි වූ ඇතුලු නුවර රඟහලක චිත්‍ර සහිත තිරයක් මන් පෙනණි ... රජතුමා කූටාගාරයෙන් බැස අශ්වයෙකු පිට අරා හිඳ ගෙන මා හුන් තැනට පැමිණියේය ... මගේ ගෙයි බිම ගල් තලාවක් වුයෙන් මේ ඇතිරිලුලෙහි නිදීමෙන් මට බොහෝ සුව පහසු ලැබිණි ... මගේ ඇඳුම් උනා සාක්කු ද එලියට ඇද පෙන්වීමට සතුටු බැව් මම රජතුමාට දැන්වූයෙමි ... මෙතැන් සිට කුරු රට වැසියෝ මා ඔවුන්ගේම එකෙකු යැයි සලකන්නාක් මෙන් මා කරා පැමින රිසි සේ කවටකම් කරන්නට පටන් ගත්හ .... ඇතැම්විට මා කුරු මිනිසුන් හය දෙනෙක් අතුල් තලයට ගන්නා විට ඔවුහු අත් ලෙලව ලෙලවා නටති... ගෑණු පිරිමි ළමයි විශාල පිදුරු ගොඩකට බසින්නාක් මෙන් මගේ කෙස් වැටියේ බැස සැඟවෙමින් හැංගිමුත්තන් කෙලෙති... දවසක් රජතුමා රටේ දක්ෂ නැට්ටුවන් ගෙන්වා මා ඉදිරියේ නැටෙව්වේ ය... මේ තරම් සමත් නැට්ටුවන් මා අන්කිසි රටකදී දැක නැත ... බිමින් අගලු දෙළහක් උස් කොට වූ දැවියත් පමණ දික් වූ නූල්පොටක නැගී පිනුම් ගැසීම ආදියෙන් නැටුම් දක්වන්නවුන්ගේ ක්‍රිඩා විස්මය ජනකය ... මෙම කෘතිය තුල ගලිවරයා ගත කරන ක්‍රීඩා හා විශ්‍රාන්තිමය අවස්ථාවන් ඉහතින් ඉදිරිපත් කර තිබේ.

මාර්ටින් වික්‍රමසිංහ(2009), ගලිවරායණය, සරස,සී/ස සරස (පෞද්ගලික)සමාගම, 18/3,කිරිමණ්ඩල මාවත,නාවල,රාජගිරිය.